# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1912/27 - 2015 අප්‍රේල් මස 29 වැනි බදාදා - 2015.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත

10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

**ලාහුගල ප්‍රාදේශීය සභාව**

ලාහුගල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන ගංඇති දයාරත්න මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභිකධුරය ඔහු විසින් අත හැර ඇති බව ලාහුගල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම් භාර නිලධාරී,
ලාහුගල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 28 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

05 - 361

---

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත

10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

**ලාහුගල ප්‍රාදේශීය සභාව**

ලාහුගල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන අජිත් තුෂාන්ත වර්ණරත්න ජයසූරිය මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභිකධුරය ඔහු විසින් අත හැර ඇති බව ලාහුගල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම් භාර නිලධාරී,
ලාහුගල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 28 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

05 - 362

1A - G 21467 — 51 (2015/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත

10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව**

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන එලවැල්ලේ ගෙදර චින්තක සුමිත් කුමාර මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභිකධුරය ඔහු විසින් අත හැර ඇති බව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම් භාර නිලධාරී,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

05 - 363

---

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම

මිය යාම හේතු කොට ගෙන කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අනුර සෙනවිරත්න කුඹුරේගෙදර නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන වීරසේකර මුදියන්සේලාගේ හර්ෂ කුමාර වීරසේකර මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී තලන්ගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, වීරසේකර මුදියන්සේලාගේ හර්ෂ කුමාර වීරසේකර මහතා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම් භාර නිලධාරී,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

05 - 364

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.